**සූරියවැව ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 22 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 15 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය
**------**

මෙම වාර්තාවේ 1.3.2 හා 1.3.6 ඡේදවල දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට සූරියවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**---------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**------------------------**

ගිණුම් තැබීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**---------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපාර බදු, බලපත්‍ර ගාස්තු හා කුලී යන ගිණුම් වල අගය රු. 100,800 ක් හා සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු. 63,707 ක් අඩුවෙන් ශේෂපත්‍රයේ දැක්වුණි.

(ආ) සේවක ඇප තැන්පත් වගකීම් ගිණුමේ වූ රු. 629,356 ක ශේෂය, ඇප තැන්පත් පොලී ගිණුමේ වූ රු. 158,661 ක ශේෂය සහ මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් වැඩිපුර ප්‍රතිපූර්ණය වී තිබූ රු. 1,560 ක ශේෂය සහ ආදායම් විෂයයන් 4 කට හා වියදම් විෂයයකට අදාළ එකතුව රු. 254,958 ක් වූ වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාළ රු. 3,086,732 ක ප්‍රාග්ධන වියදම් සහ රු. 2,728,135 ක ප්‍රාග්ධන ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සේවක ඇප තැන්පත් පොලී ගිණුමේ ආරම්භක ශේෂය රු. 75,287 ක් අඩුවෙන් දැක්වුණි.

(ඉ) මෝටර් ග්‍රේඩරයක් මිලදී ගැනීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගත් ණය මුදලේ වර්ෂ අවසානයට වූ රු.1,900,000 ක හිඟ ශේෂය ගිණුම්වලින් අත්හැරී තිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

--------------------------

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් විෂයයන් 8 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු. 1,122,164 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.4 ලැබියයුතු ගිණුම්

-----------------

සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු කර්මාන්ත ආධාර වල වටිනාකම රු. 11,442,346 ක් වූ අතර, ඊට ඉකුත් වර්ෂයට අදාළව ලැබියයුතු රු. 2,728,137 ක ශේෂයක් ද ඇතුළත් වී තිබුණි.

### 1.3.5 ගෙවියයුතු ගිණුම්

---------------------

ඉකුත් වර්ෂයේ ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 8 ක් වෙනුවෙන් රු. 3,246,391 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

එකතුව රු. 5,974,528 ක් වූ ණයගැති හා ණයහිමි ශේෂ වලට අදාළ ශේෂ සනාථ හා කාල විශ්ලේෂණද, එකතුව රු. 68,548 ක් වූ ආසියා පදනම ගිණුමට හා ජල පාරිභෝගික කමිටු ගිණුමට අදාළ ශේෂ සනාථද, එකතුව රු. 4,494,734 ක් වූ කර්මාන්ත ණයගැති, ආදායම් ණයගැති, ආරක්ෂිත ඇප තැන්පත්, රැඳවුම් තැන්පත්, ටෙන්ඩර් තැන්පත් හා විවිධ තැන්පත් යන ගිණුම් වල නොසැසඳීම් ඉවත් කිරීමට අදාළ විස්තරාත්මක උපලේඛනද, කැබ් රථයක් අලුත්වැඩියා කිරීම සඳහා ගෙවන ලද රු. 455,340 කට අදාළ ලැබුණු මිල ගණන් හා ටෙන්ඩර් මණ්ඩල තීරණද, ඉදිරිපත් නොකෙරුණු බැවින් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.7 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

පහත විස්තර දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2015 මැයි 21 දිනැති අංක 15/ විවිධ (051) දරන අමාත්‍ය මණ්ඩල තීරණය | යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවී හම්බන්තොට දිස්ත්‍රික් පළාත් පාලන ක්‍රීඩා උත්සවය වෙනුවෙන් සභා අරමුදලින් රු. 150,465 ක වියදම් දරා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | වර්ෂ 03කට පෙර කල් ඉකුත් වී තිබුණු එකතුව රු. 86,875 ක් වූ ආරක්ෂිත ඇප තැන්පත් ශේෂ පහක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 471,652 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,026,432 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,498,084 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ දෙක සමඟ සැසඳීමේදී සෑම වර්ෂයකම සභාවේ ස්වයං උත්පාදන ආදායම් වල මෙන්ම ආදායම් ආධාර ලැබීම් වල වර්ධනයක් පෙන්නුම් කෙරෙන නමුත්, පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩි වන වේගයකින් සැලකිය යුතු අගයන්ගෙන් වැඩිවී තිබුණි.

(ආ) සභාවේ ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා සමාලෝචිත වර්ෂය ඇතුළු ඉකුත් වර්ෂ දෙකෙහි පුනරාවර්තන වියදම් වල සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කෙරෙන අතර, සමාලෝචිත වර්ෂයේදී රු.23,830,568 ක් වූ ස්වයං උත්පාදන ආදායම් මෙන් දෙගුණයක් ඉක්මවා තිබුණි.

(ඇ) ආදායම් ආධාර නොලැබෙන්නට කිසිදු ආකාරයකින් සභාවේ ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි අතර, සමාලෝචිත වර්ෂයේදී රු.23,696,639 ක් වූ මුළු පුනරාවර්තන ආදායම් ඉක්මවා වියදම් පැවතුණි.

**2.3 ආදායම් පරිපාලනය**

---------------------

**2.3.1 වරිපනම් බදු**

-------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාර වරිපනම් බදු තක්සේරු කර අය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.3.2 බදු කුලී**

----------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) සතිපොළ බදු දීම**

------------------

(i) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 ප්‍රකාර සූරියවැව හා වෙනිවැල්ආර යන සතිපොළවල් ටෙන්ඩර් කර බදු දීමට කටයුතු නොකර කොමිස් මුදල් ගෙවීමේ පදනම මත සභාව විසින් බදු එකතු කරන්නන් පත්කර බදු අය කර තිබුණි.

(ii) සූරියවැව සතිපොළ වෙනුවෙන් රු. 2,066,123 ක් හා වෙනිවැල්ආර සතිපොළ වෙනුවෙන් රු. 88,514 ක කොමිස් මුදල් ගෙවා තිබුණි. සති පොළවල් ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කළේ නම් ගෙවන ලද කොමිස් මුදල් ඉතිරි කර ගැනීමට සභාවට හැකියාව තිබුණි.

**(ආ) කඩ කාමර කුලී**

----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට අයත් කඩ කාමර 41 ක් සඳහා කඩ කාමර කුලී සහ ප්‍රමාද ගාස්තු ලෙස පිළිවෙලින් රු. 797,300 ක් සහ රු. 79,555 ක් අයවිය යුතුව තිබුණි.

**(ඇ) එක්වන් මුදල් අය නොවීම**

--------------------------

(i) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත් පාලන කොමසාරිස්වරයාගේ චක්‍රලේඛයේ 4 ඡේදය අනුව එක්වන් මුදල් අයකර නොගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. 429,769 ක හිඟ මුදලක් පැවතුණි.

(ii) හිඟ ශේෂයට දීර්ඝ කාලයක සිට එක්වන් මුදල් නොගෙවන ලද කඩහිමියන් හතර දෙනකුගෙන් අයවිය යුතු රු. 142,726 ක් වූ නමුත්, එම කඩ කාමර සභාවට පවරා ගැනීමට හෝ එම මුදල් අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**2.3.4 ජල ගාස්තු**
**-----------**

සමාලෝචිත වර්ෂය අවසානයට ජල පාරිභෝගිකයින් 310 දෙනෙකුගෙන් රු. 157,032 ක ජල බිල්පත් ගාස්තු අයවිය යුතුව තිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**
**----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,074,187 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 126,500 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**
**--------------------------**

**3.1 කාර්යසාධන ඇගයීම**
**---------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන යෝජනා සහ සභික යෝජනා ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර, එකී යෝජනා අයවැය ලේඛනයටද ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා අපේක්ෂිත ප්‍රාග්ධන ආදායම් රු. 26,500,000 ක් වූ අතර, ප්‍රාග්ධන වියදම් රු. 28,000,000 ක් විය. කෙසේ වුවද, ප්‍රාග්ධන ආදායම් ලැබෙන මාර්ග සහ ප්‍රාග්ධන වියදම් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් විස්තර දක්වා නොතිබුණි.

(ඇ) වැය විෂයයන් 126 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින්, සලසා තිබුණු එකතුව රු. 10,189,200 ක් වූ ප්‍රතිපාදන වලින් වර්ෂය අවසානය වන විට කිසිදු වියදමක් දරා නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**
**------------------------------**

2014 දකුණු පළාත් සංවර්ධන සැලැස්මේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරාගත් පෙර පාසල් සඳහා උපකරණ ලබා දීමට වෙන්කර තිබුණු රු. 50,000 ක මුදලින් රු. 25,200 ක් අරමුණෙන් බැහැරව පෙර පාසල් ළමුන්ගේ සමූහ ඡායාරූප ගැනීම සඳහා වැයකර තිබුණි.

**3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**
**-------------------------------**

සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා හයකදී ආයතන තුනකින් මිල ගණන් කැඳවා රු. 194,950 ක වියදම් දරා ටයර් 15 ක් හා ටියුබ් 4 ක් මිලදී ගෙන තිබුණි. මිල ගණන් ඉදිරිපත් කළ බව සඳහන් කර තිබූ ආයතන තුනෙන් එක් ආයතනයක් විසින් 2015 වර්ෂය තුළ මිල ගණන් ඉදිරිපත් නොකළ බවත්, තම ආයතනයේ නම හා නිල මුද්‍රාව සහිත මිල කියුම ව්‍යාජ එකක් බවත් සභාව වෙත ලිඛිතව දන්වා තිබුණි.

## 3.4 හඳුනාගත් අලාභ

-----------------

යෝජිත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ දැල් වැට ඉදිකිරීම සඳහා රු. 1,065,900 ක වියදම් දරා මිලදී ගෙන තිබූ භාණ්ඩ වලින් කොටසක් අස්ථානගත වී තිබුණි. රජයේ මුදල් රෙගුලාසි 104 ප්‍රකාර 2013 ජූලි 09 දින ඉදිරිපත් කර තිබුණු වාර්තාවේ නිර්දේශ අනුව, රු. 101,500 ක් වූ අස්ථානගත භාණ්ඩ වල ප්‍රතිසම්පාදන පිරිවැය අදාළ පාර්ශව කරුවන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.5 කාර්යය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 13 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණු නමුත්, එම තනතුරු විධිමත් කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවට අනුමත සෞඛ්‍ය කම්කරුවන් සංඛ්‍යාව ඉක්මවා 4 දෙනෙකු බඳවාගෙන ඉන් තිදෙනෙකුට රාජ්‍ය කළමනාකරණ සහකාර, රියදුරු සහ පුස්තකාල සහායිකා යන තනතුරුවල සේවය සඳහා අනුයුක්ත කර තිබුණි.

(ඇ) සභාවට අනුමත වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 9 දෙනාගෙන් තිදෙනෙකු පමණක් එම රාජකාරිවල යොදවා ඉතිරි අය රාජ්‍ය කළමනාකරණ සහකාර, මුර අංශයේ මෙන්ම, විදුලි අංශයේ සහ පිළිගැනීමේ නිලධාරී යන තනතුරු වල සේවයේ යොදවා තිබුණි.

(ඈ) මාර්ග අංශයේ කම්කරුවන් වෙනත් කටයුතු වල සේවයේ යෙදවීම නිසා එම කටයුතු සඳහා බාහිර කම්කරුවන්ගේ සේවය ලබා ගෙන සමාලෝචිත වර්ෂයේ අවස්ථා පහකදී රු.191,400 ක කම්කරු කුලී ගෙවීමට සිදුවී තිබුණි.

## 3.6 බලය නොලත් ගනුදෙනු

--------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) සහ (ඔ) යන වගන්ති ප්‍රකාර අමාත්‍යවරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබා නොගෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි විහාරස්ථාන 04 ක් සහ පෙර පාසල් 05 ක් සඳහා සිමෙන්ති සහ උපකරණ ලබාදීම සඳහා අවස්ථා 5 කදී එකතුව රු. 209,585 ක වියදම් දරා තිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-------------------------------------

## 4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයක සම්පූර්ණ ප්‍රතිපාදනයද, තවත් වියදම් විෂයයන් 07ක රු.30,147,722 ක් වූ ඉතිරි කිරීම්ද, වෙනත් වියදම් විෂයයන් 02ක සීමාව ඉක්මවූ රු.5,827,897 ක් වූ වියදම්ද, ආදායම් විෂයයන් 04 ක ළඟා කර නොගත් රු.22,517,703 ක ඉලක්කයන්ද නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/ 01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියෙකු පත්කර තිබූ නමුත්, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට නොහැකි වී තිබුණි. විගණන සැලැස්ම සහ විගණන වාර්තා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 134 (2) හා (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

## 4.4 වත්කම් කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

### (අ) පවරා නොගත් වත්කම්

සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් අටක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම වී නොතිබුණි.

### (ආ) භාණ්ඩ සමීක්ෂණය

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී, වීරියගම සහ සූරියවැව යන පුස්තකාල වල රු. 82,295 ක් වටිනා පොත් 436ක ඌනතාවයක් වාර්තා කර තිබුණද, ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.5 බේරුම් නොකළ බැරකම්

2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් වල මුළු වටිනාකම රු. 12,595,028 ක් වූ අතර, ඊට ඉකුත් වර්ෂයට අදාළ රු. 3,151,718 ක බැරකම් ඇතුළත් වී තිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) සේවක මණ්ඩල කළමනාකරණය